සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# ශිල්ප කලා - I

10 ශ්‍රේණිය | කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

---

01. විද්වතුන් ඉදිරිපත් කරන නිර්වචන අතර රටක ස්වාධීනත්වය පිළිඹිබු කරන්නාවූ කැඩපතක් ලෙස හඳුන්වන කලාව වන්නේ,
    (1) වෙස් මුහුණු කලාව (2) ජන කලාව (3) පන් පැදුරු කලාව (4) නැටුම් කලාව

02. ලාංකේය සිව්සැට කලාවේ බුද්ධිමතුන් අතින් පෝෂණය කලාව කුමක්ද?
    (1) ජන කලාව (2) විදග්ධ කලාව (3) සොකරි නාට්‍ය (4) නාඩගම් කලාව

03. රූප සටහනින් දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණ කිනම් හැඩතලයට අයිතිවේ ද?
    (1) තල ජ්‍යාමිතිය
    (2) ත්‍රිමාණරූප
    (3) ඝන ජ්‍යාමිතිය
    (4) සරල ජ්‍යාමිතිය



04. 
    මෙම උපකරණ භාවිතයෙන් ඇඳිය හැකි කෝණ වන්නේ,
    (1) $15^0$ ගුණාකාරයෙන් යුත් අගයන් සහිත
    (2) $60^0$ කෝණ පමණි
    (3) $90^0$ කෝණ පමණි
    (4) ඕනෑම අගයන් සහිත කෝණ පමණි

05. ජ්‍යාන්තර සම්මත කඩදාසි වර්ගීකරණයට අනුව ජ්‍යාමිතික නිර්මාණ ඇඳීමට යොදා ගන්නා $A_4$ කඩදාසියේ ප්‍රමාණය වන්නේ,
    (1) 210mm x 297mm (2) 341mm x 1139mm
    (3) 420mm x 594mm (4) 148mm x 210mm

06. ජ්‍යාමිතික නිර්මාණ සඳහා යොදා ගන්නා පැන්සල් 'H' අගය වැටිවන විට පැන්සලේ ස්වභාවය වන්නේ,
    (1) මිනිරන්වල කළු පැහැය වැඩිවේ. (2) මිනිරන් කූර සියුම් වේ.
    (3) මිනිරන්කූරේ තද බව වැඩිවේ. (4) මිනිරන්වල මෘදු ගතිය වැඩිවේ.

07. ජ්‍යාමිතික ඇඳීමේදී මධ්‍ය අක්ෂය හෝ සමමිතික බව දැක්වීමට යොදා ගන්නා රේඛා වර්ගය කුමක් ද?
    (1) සිහින් අඛණ්ඩ රේඛා (2) සිහින්දාම රේඛා
    (3) දෙකෙලවර ඝනදාම රේඛා (4) කඩ රේඛා

08. රූප සටහන අනුව අඳුරු කර ඇති කොටස හඳුන්වන නම කුමක් ද?
    (1) වෘත්ත පාදය
    (2) වෘත්ත ඛණ්ඩය
    (3) කේන්ද්‍රික ඛණ්ඩය
    (4) ජ්‍යාය ඛණ්ඩය



09. කෝණයේ අගය $90^0$ ට වැඩි අංශක $1800^0$ අඩු කෝණ හඳුන්වන්නේ,
   (1) පරාවර්ථ කෝණ ලෙසය. (2) ඍජු කෝණ ලෙසය.
   (3) සරල කෝණ ලෙසය. (4) මහා කෝණ ලෙසය.

10. පාද සියල්ලම අසමාන සම්මුඛ පාද දෙකක් පමණක් සමාන්තරව පිහිටන චතුරස්‍රය හඳුන්වන්නේ කිනම් නමකින් ද?
   (1) ආයත චතුරශ්‍රය (2) රොම්බසය (3) ත්‍රිපීසියම (4) රොම්බාභය

11. වර්ණ ගැන්වීම තුළින් රෙදිපිළි අලංකාර කරගත හැකිය. මෙහිදී මුද්‍රණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (1) පෙහෙකම් ද්‍රව්‍යයක බාහිර උපකරණයකින් සායම් ගැල්වීමයි.
   (2) මුළු පෙහෙකම් ද්‍රව්‍ය පුරාම වර්ණ පැතිරයාම සිදු කිරීමයි.
   (3) බාහිර උපකරණ ඇසුරින් පෙහෙකම් ද්‍රව්‍ය මත සායම් සහිත මුද්‍රා තැබීමයි.
   (4) වර්ණ සහිත භාජනය පෙහෙකම් ද්‍රව්‍ය ගිල්ලවීම.

12. අතීතයේ වර්ණලබා ගැනීමට භාවිත කරන ලද්දේ පාරිසරික සම්පත්ය. මෙහිදී නිල්වර්ණය සාදා ගන්නා ලද්දේ කුමන ශාකයෙන් ද?
   (1) ගොකටු ගසේ කිරි වලින් (2) නිල් අවරිය ගසෙන්
   (3) මකුළු මැටි භාවිතයෙන් (4) සාදිලිංගම් වලින්

13. අතීතයේ වර්ණ ගැන්වීමේදී පඬු දියරයේ සිවුරු පොගවා වර්ණ තහවුරු කර ගැනීමට යොදා ගන්නා ලද ශාක වර්ගය කුමක් ද?
   (1) තේක්ක කොළ වලිනි (2) කහ වර්ග වලිනි
   (3) බෝම්බු කොළ වලිනි (4) රත්මල් වලිනි

14. වර්ණ ආලේපකරණයේදී තුනී පාරදෘශ්‍ය සායම් පදාසයක් ආලේප කිරීම හඳුන්වන නම කුමක් ද?
   (1) යටි ආලේපය නමිනි. (2) අඳුරු කරුණය නමිනි.
   (3) අධි ආලෝකකරණය නමිනි. (4) සේදුම නමිනි.

15. සේද කෙඳි එකිනෙකට සම්බන්ධ වී ඇත්තේ සෙරසින් නැමති මැලියම් විශේෂයකිනි. මැලියම් ඉවත් කිරීමට යොදා ගනු ලබන්නේ,
   (1) රසායනික ද්‍රව්‍ය යොදා සේදීමෙනි.
   (2) සබන් ද්‍රාවණයක පැය 02 ක් තම්බා පිරිසිදු ජලයෙන් සේදීම.
   (3) සල්පියුරික් අම්ලය භාවිත කර සේදීම.
   (4) කෝස්ටික් සෝඩා යොදා සේදීම.

16. පින්සල් වැනි සම්මත උපකරණ භාවිතයෙන් තොරව සිදුකරන ශිල්පීය ක්‍රමය හඳුන්වන නාමය කුමක් ද?
   (1) සරල පින්තාරුව (2) අතින් පින්තාරුව (3) සායම් පෙවීම (4) වර්ණ පැතිරවීම

17. කපු වර්ග අතරින් ඉතාම උසස් කපු වර්ගය ලෙස සැලකෙන්නේ,
   (1) ඇමරිකන් උස් බිම් කපු (2) පීරු හෙවත් දකුණු ඇමරිකානු කපු
   (3) පීලර් කපු (4) සී අයිලන්ඩ් කපු

18. සත්වයන්ගෙන් ලෝම කෙඳි ලබා ගැනීමේදී කාශ්මීර එළුවාගෙන් ලබා ගන්නා කෙඳි ඉතා වටිනාකමින් ඉහළය. මෙම කෙඳි වලින් වියාගන්නා ලද රෙදි වර්ගය මොනවද?
   (1) සිල්ක් රෙදි (2) කාශ්මීර සළු (3) ලිනන් රෙදි (4) සූට් රෙදි

19. කෙඳි පැල්ලම් පරීක්ෂණයට භාජනය කිරීමෙන් හණකෙඳි වලට ලැබෙන වර්ණය වන්නේ,
   (1) රතුදම් පාට (2) රන්වන් දුඹුරු පාට
   (3) දුඹුරු පාට (4) දුඹුරු පැහැති දම් පාට

20. පහත රූප සටහනින් පෙන්වන්නේ චාම් වියමන් රටාවේ ප්‍රභේදයක් වන ජටා වියමන් රටාවකි. මෙහි නූල් බැඳීම සිදුවන්නේ කුමක ආකාරයට ද?



(1) නූල් එකක් හැර එකක් බැඳීම
(2) සමාන දික් හරස් නූල් අතර බැඳීම
(3) දික් නූලක් හරස් නූල් දෙකක් බැඳීම
(4) දික් නූල තුනක් සමග හරස් නූලක් බැඳීම

21. මැටිවල යකඩ ප්‍රතිශතය අඩු නිසා සුදු පැහැයෙන් යුතු මැටි වර්ගය කුමක් ද?
(1) බෝල් මැටි (2) රතු මැටි (3) කෙඔලින් මැටි (4) මකුළු මැටි

22. මැටිවල භෞතික ගුණාංගයකි හැකිළීම. හැකීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(1) ජලය උරා ගැනීමේ හැකියාව.
(2) මැටිවල ඇලෙන සුළු බවයි.
(3) මැටි භාණ්ඩ පිළිස්සීමේදී වර්ණය වෙනස් වීමයි.
(4) මැටි භාණ්ඩ පිළිස්සීමේදී භාණ්ඩයේ පරිමාව අඩුවීමයි.

23. කළුතර දෙදියවල පිහිටි මැටි හඳුන්වන නම කුමක් ද?
(1) බෝල් මැටි (2) රතු මැටි (3) ගිනි මැටි (4) තලප මැටි

24. අච්චු භාවිත කර භාණ්ඩ තැනීම හඳුන්වන නම කුමක් ද?
(1) ඇඹීම (2) වාත්තු කිරීම (3) ඉදි කිරීම (4) මුද්‍රණය කිරීම

25. පහත සඳහන් අමුද්‍රව්‍ය වලින් නොඇලෙන සුළු අමු ද්‍රව්‍ය නම් කරන්න.
(1) මකුළු මැටි (2) ඩොලමයිට් (3) රතුමැටි (4) කෙඔලින්

26. මැටි තහඩු භාවිත කර මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී තහඩු එකිනෙකට සම්බන්ධ කිරීමට භාවිත කරන්නේ මොනවා ද?
(1) ග්‍රොග් (2) ගම් (3) මැටිපාප්ප (4) සෙලෝටේප්

27. මැටි භාවිතයෙන් ඕනෑම නිර්මාණයක් හෝ රූපයක් අතින් නිර්මාණය කිරීම හඳුන්වන නම කුමක් ද?
(1) ඉදි කිරීම (2) තහඩු භාවිතයෙන් ඉදි කිරීම
(3) අච්චු භාවිතයෙන් ඉදි කිරීම (4) ඇඹීම

28. පැච්වර්ක් නිර්මාණ අලංකාර කිරීමට යොදා ගත හැකි මැහුම් ක්‍රම නම් කරන්න.
(1) දම්වැල් මැස්ම, ලේසිඩේසි මැස්ම (2) කෙලින් මැස්ම, රිබන් මැස්ම
(3) දම්වැල් මැස්ම, රිබන් මැස්ම (4) ලූප් මැස්ම, නැටි මැස්ම

29. පහත සඳහන් උපකරණ අතරින් ගෙතීම සඳහා භාවිත කරන උපකරණයක් නොවන්නේ,
(1) වූල් ගොතන කටු (2) තැටින් කටු
(3) හර්නල් කටු (4) ස්ට්‍රැප්ස්ටි ඉදිකටු

30. ගෙතීමේදී දම්වැල ගෙතීමෙන් පසු කරනු ලබන දෙවන පියවර හඳුන්වන නම කුමක් ද?
(1) පත්තැයා රේන්ද පටිය ගෙතීම (2) තනිපට පිරවිලි ගෙතීම
(3) තොන්ඩුවක් ගෙතීම (4) පිරවිලි පිරවීම

31. විවිධ ගෘහ උපාංග නිර්මාණය කිරීම සඳහා ගෘහනියන් ඇඳුම් මැසීමේ දී ඉදිරිවන රෙදි කොටස් භාවිතා කර ඇත. ගෘහ උපාංග දක්වෙන පිළිතුර තෝරන්න.
(1) අල්මාරි, ඇඳන්, තිරරෙදි
(2) තිරරෙදි, මේස රෙදි, අල්මාරි
(3) ඇඳ ඇතිරිලි, තිරරෙදි, ජනෙල් රෙදි
(4) බිත්ති සැරසිලි, කුෂන් කවර, බඳුන් පලස්

32. දරුවන් සඳහා සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණය කිරීමේදී අපගේ අවධානය යොමු විය යුතු ප්‍රධාන කරුණු සහිත පිළිතුර තෝරන්න.

A - දරුවාගේ වයසට හා පරිනතියට ගැළපීම
B - දරුවාගේ දෙමාපියන්ට ප්‍රසන්න බව ඇතිවන සේ සෙල්ලම් බඩු නිර්මාණය කිරීම
C - දරුවන්ගේ ශරීර සෞඛ්‍යයට හිත කර රෙදි වර්ග තෝරා ගැනීම
D - සෙල්ලම් කිරීමේදී කොටස් නොගැලවී යන ලෙස ශක්තිමත්ව මසා තිබීම

(1) ABC (2) ACB (3) ABD (4) BCD

33. සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණය කිරීමේදී භාවිතා කරන මාධ්‍ය වන්නේ,
(1) රෙදි කැබලි හා පුලුන් ය (2) රෙදි කැබලි හා පොල් ඊල් ය
(3) පැඩිං හා පොල් ඊල් ය (4) පුලුන් හා විවිධ කෙඳිය

34. පහත දක්වා ඇති පතරොම් කොටස් වලින් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන සුරතල් සත්වයා වන්නේ,



(1) පෙන්ගුයින්ය (2) බලුපැටියාය (3) වළහාය (4) හාවාය

35. පේපර් ක්විලින් නිර්මාණය සඳහා තීරුපටි කපා ගැනීමට කඩදාසි විරූපණ යන්ත්‍රය වෙනුවට අපට භාවිත කළ හැකි උපකරණ වන්නේ,
(1) රූලක්, පැන්සලක්, කතුරක් ය. (2) බෙදුම් කටුව, පැන්සලක්, කතුරක් ය.
(3) පැන්සලක්, කතුරක්, පිහියක් ය. (4) ලෑලි කැබැල්ලක්, පැන්සලක්, කතුරක් ය.

36. පේපර් ක්විලින් නිර්මාණය කිරීමේදී කඩදාසි පටි රෝල් කිරීම සඳහා භාවිතා කරන ටූලය වෙනුවට යොදාගත හැකි අනුයෝගී උපකරණය කුමක් ද?
(1) පැන්සල ය. (2) CD තැටිය. (3) ටූත් පික් ය. (4) කතුරක් ය.

37. පේපර්කුවිලින් නිර්මාණයට අලංකාර නිමාවක් ලබා දීමට අප අවධානය යොමු කරණු නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.

A - නිර්මාණය රෙදි රාමුවක සවි කිරීම
B - නිර්මාණය සුදුසු වර්ණවත් පසුබිමක අලවා ගැනීම
C - දාරවල තද වර්ණයෙන් පටි අලවා ගැනීම
D - දාරවල අග දෑති කැපීම හා අවුට් ලයින් යෙදීම

(1) ABC (2) BCD (3) CDA (4) ABD

38. ක්‍රි.පූ. 5000 පමණ වූ ඉපැරණි ශිෂ්ටාචාරක මනරම් උද්‍යාන තිබූ බවට තොරතුරු හමුවන ශිෂ්ටාචාර වන්නේ,
(1) මොහෙන්ජෝදාරෝ, හරප්පා (2) බැබිලෝනියා හා චීන ශිෂ්ටාචාරය
(3) චීන ශිෂ්ටාචාරය හා ග්‍රීක ශිෂ්ටාචාරය (4) ග්‍රීක ශිෂ්ටාචාරය හා බැබිලෝනියා ශිෂ්ටාචාරය

39. උද්‍යාන අලංකරණ නිර්මාණය කිරීමේදී හැඩතලවල පරිමාව නියමිත ප්‍රමාණයට යොදා ගැනීම හඳුන්වන උද්‍යාන විද්‍යා මූල ධර්මය වන්නේ,
(1) අවකාශය (2) සමබරතාව (3) සම්පින්ඩනය (4) අනුපාතය

40. මූර්ති නිර්මාණයේදී අතීතයේ ශිල්පීන් භාවිතාකළ ගල් මාධ්‍ය ලෙස භාවිත කළ ගල් වර්ග මොනවා ද?
(1) කලුගල් හා ගඩොල් ය (2) කබොක්ගල් හා කලු ගල් ය
(3) කලුගල් හා හුණු ගල් ය (4) සිමෙන්ති ගල් හා හුණු ගල් ය

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **ශිල්ප කලා - II** කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඔබ ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ''විසිතුරු නිමැවුම් ගමට සවියක්'' වෙළඳ ප්‍රදර්ශනයක් හා සංස්කෘතික සංදර්ශනයක් පැවැත්වීමට සූදානම් වෙයි.

i. විසිතුරු නිමැවුම් කලහැකි ජනකලා කර්මාන්ත 02 ක් නම් කරන්න.

ii. ඉහත ඔබ නම් කළ කර්මන්ත වලින් කළ හැකි භාණ්ඩ 02 ක් නම් කරන්න.

iii. ගෘහ කර්මන්ත ලෙස පවත්නා පාරම්පරික කර්මන්ත 02 ක් ලියන්න.

iv. පන් හා කෙඳි ආශ්‍රිතව කළ හැකි නිර්මාණ 02 ක් නම් කරන්න.

v. ඉවත් කරන ලද රෙදි කැබලි වලින් කළ හැකි නිර්මාණ 02 ක් නම් කරන්න.

vi. විසිතුරු නිමැවුම් කිරීමට ස්වාභාවික සායම් ලබාගත හැකි අමුද්‍රව්‍ය 02 ක් හා එයින් ලබාගත හැකි වර්ණ ද ලියන්න.

vii. රෙදි පිළි අලංකරණය කිරීමේ ක්‍රම අතරින් ස්ටෙන්සිල් මුද්‍රණය කිරීමට සුදුසු මෝස්තරයක් අඳින්න.

viii. මැටි දරුණු භාවිතයෙන් කළ හැකි නිර්මාණයක අනුරුවක් අඳින්න.

ix. විසිතුරු මැහුම් ක්‍රම යොදා බිත්ති සැරසිල්ලක් කිරීමට සූදානම් කර තිබුණි. සුදුසු මැහුම් ක්‍රම 02 ක් ඇඳ නම් කරන්න.

x. උද්‍යාන අලංකරණ නිර්මාණය කිරීමට සූදානම් කර තිබූ අතර ඒ සඳහා සත්ව රූප 02 ක රූප සටහන් නිර්මාණය කරන්න.

(ලකුණු 2x10=20)

(02) මෙහි පහත දැක්වෙන්නේ ඝන කඩදාසි වලින් නිර්මාණය කරන ලද ඇසුරුමකි.



i. මෙම හැඩයෙන් වෙළඳ පොළෙහි දැකිය හැකි ඇසුරුම් ද්‍රව්‍ය 04 ක් නම් කරන්න. (ල.02)

ii. මෙහි ඉදිර පෙනුම හා සැලැස්ම අඳින්න. (ල.04)

iii. ඔබ කැමති මිම් යොදා මෙහි විකසනය අඳින්න. (ල.04)

(03) රෙදි පිළි අලංකරණයේදී පෙහෙකම් ද්‍රව්‍යයට හොඳින් සායම් උරා ගැනීම සඳහා පෙර පිරියම් හා පසු පිරියම් කිරීම අවශ්‍ය වේ.

i. පෙර පිරියම් කිරීම යනු කුමක් ද? (ල.02)

ii. රෙදි පිළි අලංකරණයේ දී සායම් පෙවීම සඳහා යොදා ගන්නා අලංකරණ ක්‍රම 02 ක් නම් කර එයින් එක් ක්‍රමයකින් නිර්මාණය කළ හැකි නිර්මාණ 04 ක් ලියන්න. (ල.04)

iii. ඔබ කැමති රෙදි පිළි අලංකරණ ක්‍රමයක් පිළිබඳ රූප සටහනක් සහිතව විස්තර කරන්න. (ල.04)

(04) රෙදි නිෂ්පාදනයට භාවිත කරන කෙඳි පෙහෙකම් කෙඳි ලෙස හඳුන්වයි.

i. කෙඳි වර්ග ලබාගන්නා ප්‍රභවය අනුව වර්ග කර දක්වන්න. (ල.02)

ii. රෙදි පිළි පරීක්ෂා කිරීමේදී අවධානය යොමු විය යුතු කරුණු 04 ක් නම් කරන්න. (ල.04)

iii. වියමන් රටා වර්ගකර ඔබ කැමති රටාවක් ඇඳ නම් කරන්න. (ල.04)

(05) භෞතික හා රසායනික සහ ජීව විද්‍යාත්මක හේතූන්ගේ බලපෑම මත ඇලුම්නා සිලිකේට් හෙවත් මැටි නිර්මාණය වේ.

i. මැටි නිර්මාණයවන ක්‍රියාවලිය අනුව වර්ග කර ඒවා හඳුන්වන්න. (ල.02)

ii. මැටි වල භෞතික හා රසායනික ගුණ නම් කර හඳුන්වන්න. (ල.04)

iii. (a) භාණ්ඩ නිෂ්පාදනයට සුදුසු පරිදි මැටි සකස් කර ගැනීම මැටි පදම් කිරීමයි. මැටි පදම් කිරීමේ ක්‍රම 02 ක් නම් කරන්න.

(b) මැටි තහඩුවක් ආධාරයෙන් මල් බඳුනක් සාදා ගන්නා ආකාරය පියවර ලෙස විස්තර කරන්න. (ල.04)

(06) විසිතුරු කලාව කෙරෙහි අප කාගේත් සිත් යොමු වේ.

i. ගෙතීම සඳහා භාවිතා කරන විවිධ ද්‍රව්‍ය වර්ග 02 ක් නම් කරන්න. (ල.02)

ii. උසස් නිමාවකින් යුතු සෙල්ලම් භාණ්ඩ නිර්මාණය කිරීමේදී විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු 04 ක් ලියන්න. (ල.04)

iii. කඩදාසි මගින් සුභ පැතුම් පතක් සකස් කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ල.04)

(07) උද්‍යාන අලංකරණය වර්තමානයේ ජනප්‍රිය කලාවක් බවට පත්ව ඇත.

i. උද්‍යාන අලංකරණ මූර්ති නිර්මාණයේදී විවිධ ශිල්පීය ක්‍රම භාවිත කරයි. ඒ සඳහා භාවිත කරන ශිල්පීය ක්‍රම 02 ක් නම් කරන්න. (ල.02)

ii. උද්‍යාන අලංකරණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම 04 ක් නම් කරන්න. (ල.04)

iii. ඔබ කැමති ආකාරයට උද්‍යානයකට සුදුසු මූර්තියක් නිර්මාණය කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**10 ශ්‍රේණිය** **ශිල්ප කලා**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2 ) | 02. (2 ) | 03. ( 3) | 04. (1 ) | 05. ( 1) | 06. ( 3) | 07. ( 2) | 08. ( 3) | 09. ( 4) | 10. ( 3) |
| 11. (3 ) | 12. (2 ) | 13. ( 3) | 14. (4 ) | 15. ( 2) | 16. ( 3) | 17. ( 4) | 18. ( 2) | 19. ( 4) | 20. ( 2) |
| 21. (3 ) | 22. (4 ) | 23. ( 1) | 24. (1 ) | 25. ( 2) | 26. ( 3) | 27. ( 4) | 28. ( 1) | 29. ( 4) | 30. ( 2) |
| 31. (4 ) | 32. (2 ) | 33. ( 3) | 34. (1 ) | 35. ( 1) | 36. ( 3) | 37. ( 2) | 38. ( 1) | 39. ( 4) | 40. ( 3) |

## II පත්‍රය

(01) i. මැටි කර්මාන්තය, පේෂ කර්මාන්තය, බීරළු කර්මාන්තය ආදිය

ii. ● මැටි කර්මාන්තය - මල් පෝච්චි - බිත්ති සැරසිලි ● පේෂ කර්මාන්තය - සාරි, සරම්, බිත්ති සැරසිලි

iii. වඩු කර්මාන්තය, පිත්තල කර්මාන්තය, කෙඳි කර්මාන්තය ආදිය

iv. පැදුරු, කලාල, වට්ටි, පෙට්ටි

v. කුෂන් කවර, පාපිසි, බිත්ති සැරසිලි ආදිය

vi. ● මකුළු මැටි - සුදු ● නිල් අවරිය - නිල් ● අඳුන් - කලු

vii. සුදුසු මෝස්තරයකට ලකුණු ලබා දෙන්න.

viii. සුදුසු අනුරුවකට ලකුණු ලබා දෙන්න.

ix. දම්වැල් මැස්ම, බ්ලැන්කට් මැස්ම, කතිර මැස්ම

x. රූප සටහන ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2x10=20)

(02) i. සබන් දවටන, කිරි පෙට්ටි, බල්බ් ඇසුරුම් පෙට්ටි, විවිධ බෙහෙත් වර්ග ඇසුරුම් පෙට්ටි (ල.02)

ii. ඉදිරි පෙනුම, සැලැස්ම නිවැරදිව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

iii. මිමි යොදා විකසනය ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(03) i. නිෂ්පාදිත රෙදිවල ස්වාභාවික හා බාහිරව එක්වූ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලියයි. (ල.02)

ii. ● බතික් - සාරි, සරම්, ගවුම් රෙදි, බිත්ති සැරසිලි, කමිස රෙදි ● ගැටපඬු මුද්‍රණය - බිත්ති සැරසිලි, කුෂන් කවර, ලේන්සු ආදිය (ල.04)

iii. පිළි අලංකරණය පිළිබඳ රූප සටහනක් ඇඳ විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

(04) i. ශාක, සත්ව, ඛනිජ, කෘතිම (ල.02)

ii. රෙදි වර්ගයේ ස්වභාවය, කෙඳි වල ශක්තිය, ජල අවශෝෂණය, සායම් උරා ගැනීම, රසායනික ද්‍රව්‍යවලට දක්වන ප්‍රතික්‍රියා (ල.04)

iii. වාම්, හීරි, සැටින් වාම් ප්‍රභේදයේ රටාවක් ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

(05) i. ප්‍රාථමික හා ද්විතියික / ● ප්‍රාථමික - ජීරණය වූ ස්ථානයේ තැන්පත් වේ. පැහැයෙන් සුදු වර්ණය ගනී. ● ද්විතියික - ස්වභාවිකව ප්‍රවාහනයේදී වෙනත් ස්ථානයක තැන්පත් වන මැටි, විවිධ වර්ණවලින් යුක්තය (ල.02)

ii. ● සුවිකාර්යතාව - ඇලෙන සුලු බව ● සවිවරතාව - ජලය උරාගැනීමේ හැකියාව ● හැකිළීම - වියළීමෙන් හා පිළිස්සීමෙන් භාණ්ඩයේ පරිමාව අඩුවීම ● වර්ණය - පෝසිලේන් භාණ්ඩ සුදු පැහැය වීම, හට්ටි, මුට්ටි, වළං රතු පැහැවීම (ල.04)

iii. (a) තෙත මැටි හා වියලි මැටි වශයෙන්

(b) මැටි තහඩු ක්‍රමයට රූප සටහනක් ඇඳ විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

(06) i. වූල්, නූල්, ක්‍රෝචට්, ටුවයින් ආදිය (ල.02)

ii. දරුවාගේ වයසට හා පරිනතියට ගැලපීම, කුඩා දරුවන් ප්‍රියකරන සත්ව අනුරූ නිර්මාණ, දරුවන් තුල ප්‍රසන්න භාවය ඇති කිරීම, දරුවන්ගේ ශරීර සෞඛ්‍යයට හිතකර වීම, ජීර්ණ සංකලනය, මනාව තිබීම, සැහැල්ලු බව (ල.04)

iii. කඩදාසි මාධ්‍යයෙන් සුභ පැතුම් පතක් සකස් කරන ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

(07) i. පූර්ණ උන්නත, අල්ප උන්නත, අර්ධ උන්නත (ල.02)

ii. අවකාශය, සම්පිණ්ඩනය, විවිධත්වය, සමබරතාවය, තෝරාගත යුතු ස්ථානය, කැපී පෙනෙන බව (ල.04)

iii. සුදුසු මාධ්‍යයක් යොදා මූර්තියක් නිර්මාණය කරන ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)